# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2335/03 - 2023 ජුනි මස 05 වැනි සඳුදා - 2023.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමථ මණ්ඩල කොමිෂන් සභාව

සමථකාරවරුන් ලෙස පත්කිරීම සඳහා නාමයෝජනා කැඳවීමේ නිවේදනය

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 5 (1) වැනි වගන්තිය මගින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථ මණ්ඩල පනතේ 1 වැනි උපලේඛනයේ 6 වැනි වගන්තියේ සිට 11 වැනි වගන්තිය ප්‍රකාරව ධුර හිස් කරනු ලබන පහත සඳහන් සමථ මූල මණ්ඩලවල සභාපති හා සමථකාරවරුන් නැවත පත්කර ගැනීම සඳහා නාමයෝජනා කැඳවනු ලැබේ.

| *දිස්ත්‍රික්කය* | *සමථ මණ්ඩල ප්‍රදේශය* | *ධුර කාලය අවසන් වන දිනය* |
|---|---|---|
| කොළඹ | 01. රත්මලාන | 2023.01.01 |
| | 02. කැස්බෑව | 2023.01.01 |
| | 03. මහරගම | 2023.02.15 |
| ගම්පහ | 01. ගම්පහ | 2023.02.01 |
| මහනුවර | 01. යටිනුවර | 2023.02.01 |
| මාතර | 01. කඹුරුපිටිය | 2023.03.01 |
| බදුල්ල | 01. පස්සර | 2023.03.01 |
| රත්නපුර | 01. ඇලපාත | 2023.03.01 |
| යාපනය | 01. වේලනෙයි | 2023.03.01 |
| අම්පාර | 01. සම්මාන්තුරේ | 2023.02.01 |
| කිළිනොච්චි | 01. පලෙයි | 2023.03.01 |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. එකී සමථ මණ්ඩලවල සමථකාරවරුන් වශයෙන් තෝරාපත් කර ගැනීම පිණිස සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නාම යෝජනා ඉදිරිපත් කරන ලෙස මෙහි පහත සඳහන් කර ඇති (අ) පුද්ගලයින්ගෙන් (ආ) මණ්ඩලවලින්, දේශපාලනමය නොවන සංවිධානවලින් සහ ආයතනවලින් හා (ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන්/ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

(අ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක සමථ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා තමන්ගේම හැර අන් අයගේ නාම යෝජනාවක් ඉදිරිපත් කිරීමට පහත සඳහන් පුද්ගලයින්ට හිමිකම් ඇත්තේ ය.

(I) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි කාර්යාලයක නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරියෙකුට හෝ පළාත් සභා රාජ්‍ය නිලධාරියෙකුට,

(II) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පිහිටි ආගමික/පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානියෙකුට,

(III) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින විශ්‍රාමලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානියෙකුට,

(IV) සමථ මූල මණ්ඩල සභාපතිවරයෙකුට.

(ආ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක සමථ මූල මණ්ඩලයට පත්කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට පහත සඳහන් මණ්ඩලවලට, සංවිධානවලට සහ ආයතනවලට හිමිකම් ඇත්තේ ය.

(I) යටත් පිරිසෙයින් අවුරුදු පහක් තිස්සේ පවත්නා වූද, පහත සඳහන් අරමුණු එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන්නා වූ යම් මණ්ඩලයකට, සංවිධානයකට හෝ ආයතනයකට ඃ-

(අ) සමාජයේ අධ්‍යාපනික, ආගමික, සදාචාරාත්මක හෝ අධ්‍යාත්මික වර්ධනය වැඩිදියුණු කිරීම.

(ආ) සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම.

(ඇ) ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩිදියුණු කිරීම.

(ඈ) සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩිදියුණු කිරීම.

(ඉ) සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවන් සැලැස්වීම සහ සපයා දීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩසටහන් සහ කටයුතු වැඩිදියුණු කිරීම.

(ඇ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට / ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිකම් ඇත්තේ ය.

(I) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා තිබෙන පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරුන්ට.

(II) යම් සමථ මණ්ඩල ප්‍රදේශයකට, බල මණ්ඩලයට පත්වීමක් ලැබීමට හිමිකම් ඇත්තේ පහත සඳහන් තැනැත්තන්ට බැවින්, ඔවුන්ගේ නම් පමණක් පත්වීම පිණිස යෝජනා කළයුතු වේ. එනම්,

(අ) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින හෝ එම ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටි තැනැත්තන්;

(ආ) අති විශේෂ අවස්ථාගත කරුණුවලදී කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් එම සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින හෝ එම ප්‍රදේශයෙන් පිටත යම් වැඩක යෙදී සිටින තැනැත්තෙක්; සහ

(ඇ) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරියෙක්, මේ ඡේදය යටතේ නාම යෝජනා කරනු ලැබූ නිලධාරියෙකුට එම පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන සෑම සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයකට පත්වීමක් ලැබීමට සුදුසුකම් ඇත.

(ඈ) දැනට සමථකාරවරුන් වශයෙන් ක්‍රියා කරනු ලබන වසර තුන ඉක්මවා ඇති ධුරය හිස් කරනු ලැබීමට නියමිතව ඇති සමථ මූල මණ්ඩල සභාපති/සමථකාරවරුන්;

(ඉ) දැනට සේවය කරන සමථකාරවරුන් හැර නවක නාම යෝජිතයින් අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) සමත් වී තිබීම හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ඊ) දැනට සේවයේ යෙදී සිටින සමථකාරවරුන් හැර නවක නාම යෝජිතයන්ගේ වයස අවම වශයෙන් අවු. 35ක් ඉක්මවා තිබිය යුතුය.

(උ) රාජ්‍ය /අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ මූල්‍ය කටයුතුවලට සම්බන්ධ බැංකු, කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය ණය හා රක්ෂණ සේවාවේ නියුතු ආයතනයන් හි දැනට සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ නාමයෝජනා සළකා බලනු නොලැබේ.

03. (අ) ඉහත 2 වැනි ඡේදයේ සඳහන්වන පුද්ගලයින්, මණ්ඩල සංවිධාන සහ ආයතන විසින් ඉහත 2 (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති රාජ්‍ය නිලධාරින් හා රාජ්‍ය නොවන නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කිරීමට හැකිවන අතර පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කිරීමට ද ඔවුන්ට හැකිය. කිසියම් පුද්ගලයෙකුට තමන්ගේම නම යෝජනා කිරීමට නොහැක.

(ආ) ඉහත 2 (ඇ) ඡේදයේ සඳහන් කර ඇති දිස්ත්‍රික් ලේකම්වරුන්ට රාජ්‍ය නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කළහැකි අතර, ඒ අයගෙන් පස් දෙනෙකුට නොවැඩි ගණනක් කොමිෂන් සභාව විසින් අදාළ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත්කළ හැකිය.

04. නාමයෝජනා කිරීමේ ආකෘති පත්‍රය ඃ

(අ) පුද්ගලයින් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට අනුකූලවය.
(ආ) මණ්ඩල, සංවිධාන සහ ආයතන විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ආකෘති පත්‍රයට අනුකූලවය.
(ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ඇ' ආකෘති පත්‍රයට අනුකූලවය.

එක් එක් නාම යෝජනාව වෙනම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ඡේදයේ දක්වා ඇති පරිදි නාමයෝජනා ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවාම එහි ඇතුළත් කළ යුතුය.

05. නාමයෝජකගේ නිර්දේශය හේතු රහිත නිර්දේශයක් නොවිය යුතුය. සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳව සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතුය. උදාහරණයක් වශයෙන් ඔහුගේ/ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ සේවය කළ නැතහොත් යෙදී සිටි කාල පරිච්ජේදය ඔහු/ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේනම් එය ද සඳහන් කළ යුතුය.

06. කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාමයෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකිතරම් දුරට වැළකී සිටිය යුතුය. එහෙත් දැනට සිටින සමථ මූල මණ්ඩල සභාපතිවරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්ට මෙම සීමාව අදාළ නොවේ.

07. සියලුම නාමයෝජනා **2023 සැප්තැම්බර් 15** වන දිනට හෝ ඊට ප්‍රථම **කොළඹ 12, අධිකරණ මාවත, අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල, අංක 80** ලිපිනයේ පිහිටි **සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

08. සම්මුඛ පරීක්ෂණයක් මගින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථකරණ දක්ෂතා සහ උපක්‍රම පිළිබඳ ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යෝග්‍ය තැනැත්තන් තෝරාගනු ඇත.

09. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද සමථ මණ්ඩල කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

**ප්‍රියනාත් පෙරේරා,**
ලේකම්,
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2023 මැයි මස 30 වැනි දින,
කොළඹ 12,
අධිකරණ මාවත,
අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල,
අංක 80,
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දීය.

**'අ' ආකෘති පත්‍රය**

**(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයින් විසින් පිරවීම සඳහා)**

1. සමථ මණ්ඩල ප්‍රදේශය : ...........................................................................................................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ...........................................................................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :

(අ) සම්පූර්ණ නම : ...........................................................................................................

(ආ) පදිංචි ලිපිනය : ...........................................................................................................

(ඇ) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්වයෙන් ද යන බව : .............................

(I) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද?එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
දෙපාර්තමේන්තුවේ නම : ...................................................................................
රාජකාරි ලිපිනය : ...........................................................................................
ඔබ දරන තනතුර : ...........................................................................................

(II) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? නැතහොත් පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
එහි නම : ...........................................................................................
එහි ලිපිනය : ...........................................................................................
ඔබ දරන තනතුර : ...........................................................................................

(III) ඔබ විශ්‍රාමලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් විශ්‍රාමලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
ආයතනයේ නම : ...........................................................................................
ඔබ විශ්‍රාම ගන්නා විට දරන ලද තනතුර : ...................................................
ඔබ පදිංචිව සිටින සමථ මණ්ඩල ප්‍රදේශය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) : ........................................

4. ඔබ විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

(අ) ඔහුගේ/ඇයගේ සම්පූර්ණ නම : ...........................................................................

(ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ...........................................................................

(ඇ) උපන් දිනය: ...........................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය: ......................... ......................... ..............

(ඉ) දුරකථන අංකය:......................... ......................... .............................

(ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? .......................................................

(උ) ඔහු/ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? .......................................................................................

(ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න.
.........................................................................................................

(එ) ඔබගේ නිර්දේශය, ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. .................................

.............................
අත්සන.
(මුද්‍රාව තිබේනම්)

දිනය : ..............................

**'ආ'ආකෘති පත්‍රය**

**(නාමයෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතුය.)**

1. සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ............................................................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :

   (අ) එහි නම : ............................................................................................................
   
   (ආ) එහි ලියාපදිංචි/රාජකාරි ලිපිනය : ..........................................................................
   
   (ඇ) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය : ................................................
   
   (ඈ) එය කොතරම් කාලයක සිට පැවතෙන්නේ ද යන බව : ..........................................
   
   (ඉ) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය : ...............................................

4. නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

   (අ) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : .................................................. ......................
   
   (ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : .................................................... ..................................
   
   (ඇ) උපන් දිනය: ..........................................................................................................
   
   (ඈ) ජාතික හැඳුනුම්පත් අංකය: ....................................................................................
   
   (ඉ) දුරකථන අංකය:.......................................................................................................
   
   (ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? .......................................................
   
   (උ) ඔහු/ ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? ..........................................................................................
   
   (ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු දරන තනතුර සඳහන් කරන්න. ............................................................................ ..................................

5. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ/ඇයගේ නාමයෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද? එසේනම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න.

   ...........................................................................................................................

6. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ඊට හේතු ද සමග සඳහන් කරන්න.

   ......................................................................................................................................

.............................

ලේකම්.

දිනය : ..............................

(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

**'ඇ' ආකෘති පත්‍රය**

**(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිසාපති / ප්‍රාදේශීය ලේකම් විසින් පිරවිය යුතුය.)**

1. සමථ මණ්ඩල ප්‍රදේශය : ......................................................................................................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන දිසාපති / ප්‍රාදේශීය ලේකම් පිළිබඳ විස්තර :

(අ) ඔබගේ සම්පූර්ණ නම : ............................................................................................

(ආ) ඔබගේ රාජකාරි ලිපිනය : ..........................................................................................

(ඇ) ඔබ දිසාපතිව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? : .....................................................

(ඈ) ඔබ ප්‍රාදේශීය ලේකම්ව සිටින්නේ කුමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද ? : ...........................................................................
.........................................................

4. නාම යෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තර :

(අ) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : .................................................................................

(ආ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙක් ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න. :
.................................................................................................................................

(ඇ) උපන් දිනයඃ ................................................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකයඃ ..........................................................................................

(ඉ) දුරකථන අංකයඃ.............................................................................................................

(ඊ) ඔහුගේ/ ඇයගේ රාජකාරි ලිපිනය/පෞද්ගලික ලිපිනය : ...............................................

5. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිතව සඳහන් කරන්න.

.................................................................................................................................................

.............................
අත්සන.
(මුද්‍රාව තිබේනම්)

දිනය : ..............................

EOG 06 - 0013/1

## සමථ මණ්ඩල කොමිෂන් සභාව

### සමථකාරවරුන් ලෙස පත්කිරීම සඳහා නාමයෝජනා කැඳවීමේ නිවේදනය

පහත දක්වා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එනම්,

| *පරිපාලන දිස්ත්‍රික්කය* | *සමථ මණ්ඩල ප්‍රදේශය* |
|---|---|
| මුලතිව් දිස්ත්‍රික්කය | 01. වැලිඔය |
| ගාල්ල දිස්ත්‍රික්කය | 01. රත්ගම<br>02. මාදම්පාගම<br>03. වඳුරඹ |
| රත්නපුර දිස්ත්‍රික්කය | 01. කල්තොට |

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ විධිවිධාන බලපාන සමථ මණ්ඩල ප්‍රදේශ වශයෙන්, ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් සිය නියමය මගින් ප්‍රසිද්ධ කර ඇති හෙයින් ඃ

02. එකී සමථ මණ්ඩලවල සමථකාරවරුන් වශයෙන් තෝරා පත් කර ගැනීම පිණිස සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නාම යෝජනා ඉදිරිපත් කරන ලෙස මෙහි පහත සඳහන් කර ඇති (අ) පුද්ගලයින්ගෙන් (ආ) මණ්ඩලවලින්, දේශපාලනමය නොවන සංවිධානවලින් සහ ආයතනවලින් හා (ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් / ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

(අ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක සමථ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා තමන්ගේ හැර අන් අයගේ නාම යෝජනාවක් ඉදිරිපත් කිරීමට පහත සඳහන් පුද්ගලයින්ට හිමිකම් ඇත්තේ ය.

(I) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි කාර්යාලයක සේවයේ නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරියෙකුට හෝ පළාත් සභා රාජ්‍ය නිලධාරියෙකුට,

(II) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පිහිටි ආගමික/පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානියෙකුට,

(III) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින විශ්‍රාමලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානියෙකුට,

(ආ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක සමථ මූල මණ්ඩලයට පත්කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට පහත සඳහන් මණ්ඩලවලට, සංවිධානවලට සහ ආයතනවලට හිමිකම් ඇත්තේ ය.

(I) යටත් පිරිසෙයින් අවුරුදු පහක් තිස්සේ පවත්නා වූද, පහත සඳහන් අරමුණු එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන්නා වූ යම් මණ්ඩලයකට, සංවිධානයකට හෝ ආයතනයකට ඃ-

(අ) සමාජයේ අධ්‍යාපනික, ආගමික, සදාචාරාත්මක හෝ අධ්‍යාත්මික වර්ධනය වැඩිදියුණු කිරීම.

(ආ) සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම.

(ඇ) ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩිදියුණු කිරීම.

(ඈ) සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩිදියුණු කිරීම.

(ඉ) සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවන් සැලැස්වීම සහ සපයා දීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩසටහන් සහ කටයුතු වැඩිදියුණු කිරීම.

(ඇ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට / ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිකම් ඇත්තේ ය.

(I) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා තිබෙන පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරුන්ට.

(II) යම් සමථ මණ්ඩල ප්‍රදේශයකට, බල මණ්ඩලයට පත්වීමක් ලැබීමට හිමිකම් ඇත්තේ පහත සඳහන් තැනැත්තන්ට බැවින්, ඔවුන්ගේ නම් පමණක් පත්වීම පිණිස යෝජනා කළයුතු වේ. එනම්,

(අ) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින හෝ එම ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටි තැනැත්තන්;

(ආ) අතිවිශේෂ අවස්ථාගත කරුණුවලදී කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් එම සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින හෝ එම ප්‍රදේශයෙන් පිටත යම් වැඩක යෙදී සිටින තැනැත්තෙක්; සහ

(ඇ) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරියෙක්, මේ ජේදය යටතේ නාම යෝජනා කරනු ලැබූ නිලධාරියෙකුට එම පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන සෑම සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයකට පත්වීමක් ලැබීමට සුදුසුකම් ඇත.

(ඈ) දැනට සේවය කරන සමථකාරවරුන් හැර නවක නාම යෝජිතයින් අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) සමත් වී තිබීම හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(ඉ) දැනට සේවයේ යෙදී සිටින සමථකාරවරුන් හැර නවක නාම යෝජිතයන්ගේ වයස අවම වශයෙන් අවු. 35ක් ඉක්මවා තිබිය යුතුය.

(ඊ) රාජ්‍ය /අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ මූල්‍ය කටයුතුවලට සම්බන්ධ බැංකු, කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය ණය හා රක්ෂණ සේවාවේ නියුතු ආයතනයන්හි දැනට සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ නාමයෝජනා සළකා බලනු නොලැබේ.

03. (අ) ඉහත 2 වැනි ජේදයේ සඳහන් වන පුද්ගලයින්, මණ්ඩල සංවිධාන සහ ආයතන විසින් ඉහත 2 (අ) සහ (ආ) ජේදවල දක්වා ඇති රාජ්‍ය නිලධාරින් හා රාජ්‍ය නොවන නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කිරීමට හැකිවන අතර පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කිරීමට ද ඔවුන්ට හැකිය. කිසියම් පුද්ගලයෙකුට තමන්ගේම නම යෝජනා කිරීමට නොහැක.

(ආ) ඉහත 2 (ඇ) ජේදයේ සඳහන් කර ඇති දිස්ත්‍රික් ලේකම්වරුන්ට රාජ්‍ය නිලධාරින්ගේ නම් ඉදිරිපත් කළහැකි අතර, ඒ අයගෙන් පස් දෙනෙකුට නොවැඩි ගණනක් කොමිෂන් සභාව විසින් අදාළ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත්කළ හැකි ය.

04. නාමයෝජනා කිරීමේ ආකෘති පත්‍රය ඃ

(අ) පුද්ගලයින් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට අනුකූලව ය.

(ආ) මණ්ඩල, සංවිධාන සහ ආයතන විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ආකෘති පත්‍රයට අනුකූලව ය.

(ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ඇ' ආකෘති පත්‍රයට අනුකූලව ය.

එක් එක් නාම යෝජනාව වෙනම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ජේදයේ දක්වා ඇති පරිදි නාමයෝජනා ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවාම එහි ඇතුළත් කළ යුතු ය.

05. නාමයෝජකගේ නිර්දේශය හේතු රහිත නිර්දේශයක් නොවිය යුතුය. සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳව සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතුය. උදාහරණයක් වශයෙන් ඔහුගේ/ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ සේවය කළ නැතහොත් යෙදී සිටි කාල පරිච්ජේදය ඔහු/ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේනම් එය ද සඳහන් කළ යුතුය.

06. කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාමයෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකිතරම් දුරට වැළකී සිටිය යුතුය. එහෙත් ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්ට මෙම සීමාව අදාළ නොවේ.

07. සියලුම නාමයෝජනා **2023 සැප්තැම්බර් 15 දිනට** හෝ ඊට ප්‍රථම **කොළඹ 12, අධිකරණ මාවත, අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල, අංක 80** ලිපිනයේ පිහිටි **සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන පරිදි එවිය යුතු ය.

08. සම්මුඛ පරීක්ෂණයක් මඟින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් සමථකරණ දක්ෂතා සහ උපක්‍රම පිළිබඳ ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යෝග්‍ය තැනැත්තන් තෝරා ගනු ඇත.

09. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද සමථ මණ්ඩල කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

**ප්‍රියනාත් පෙරේරා,**
ලේකම්,
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2023 මැයි මස 30 වැනි දින
කොළඹ 12,
අධිකරණ මාවත,
අධිකරණ අමාත්‍යාංශ නව ගොඩනැගිල්ල,
අංක 80.
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දීය.

'අ' ආකෘති පත්‍රය

**(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයින් විසින් පිරවීම සඳහා)**

1. සමෘ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :

(අ) සම්පූර්ණ නම : ..........................................................................................................

(ආ) පදිංචි ලිපිනය : ..........................................................................................................

(ඇ) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්වයෙන් ද යන බව : ............................

(I) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
දෙපාර්තමේන්තුවේ නම : ..............................................................................
රාජකාරී ලිපිනය : ..............................................................................
ඔබ දරන තනතුර : ..............................................................................

(II) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? නැතහොත් පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
එහි නම : ..............................................................................
එහි ලිපිනය : ..............................................................................
ඔබ දරන තනතුර : ..............................................................................

(III) ඔබ විශ්‍රාමලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් විශ්‍රාමලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් පහත තොරතුරු සඳහන් කරන්න.
ආයතනයේ නම : ..............................................................................
ඔබ විශ්‍රාම ගන්නා විට දරන ලද තනතුර : ....................................................
ඔබ පදිංචිව සිටින සමෘ මණ්ඩල ප්‍රදේශය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) : ........................................

4. ඔබ විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

(අ) ඔහුගේ/ඇයගේ සම්පූර්ණ නම : ..............................................................................

(ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ..............................................................................

(ඇ) උපන් දිනය: ..............................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය: ............................................................

(ඉ) දුරකථන අංකය:........................ ........................ ........................

(ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමෘ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමෘ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? ......................................................

(උ) ඔහු/ඇය එකී සමෘ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? ..............................................................................

(ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න.
..............................................................................

(එ) ඔබගේ නිර්දේශය ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. .................................

............................
අත්සන.
(මුද්‍රාව තිබේනම්)

දිනය : ..............................

**'ආ' ආකෘති පත්‍රය**

**(නාමයෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතු ය.)**

1. සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................
2. පරිපාලන දිස්ත්‍රික්කය : ............................................................................................
3. නාමයෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :

   (අ) එහි නම : ............................................................................................................

   (ආ) එහි ලියාපදිංචි/රාජකාරී ලිපිනය : ...........................................................................

   (ඇ) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය : ................................................

   (ඈ) එය කොතරම් කාලයක සිට පැවතෙන්නේ ද යන බව : ..........................................

   (ඉ) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය : ...............................................

4. නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

   (අ) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : .......................................................................

   (ආ) ඔහු/ඇය පදිංචි ලිපිනය : ....................................................................................

   (ඇ) උපන් දිනය: .......................................................................................................

   (ඈ) ජාතික හැඳුනුම්පත් අංකය: ....................................................................................

   (ඉ) දුරකථන අංකය:....................................................................................................

   (ඊ) ඔහු/ඇය පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? .......................................................

   (උ) ඔහු/ ඇය එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? ........................................................................................

   (ඌ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙකු ද? එසේනම් ඔහු දරණ තනතුර සඳහන් කරන්න. ........................................................................... ...................................

5. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ/ඇයගේ නාමයෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද? එසේනම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න. ......................................................................................................................

6. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ඊට හේතු ද සමඟ සඳහන් කරන්න. ................................................................... ...................................................................

................................................
ලේකම්.
(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

දිනය : ..............................

'ඇ' ආකෘති පත්‍රය

**(නාමයෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිසාපති / ප්‍රාදේශීය ලේකම් විසින් පිරවිය යුතුය.)**

1. සමථ මණ්ඩල ප්‍රදේශය : ..........................................................................................

2. පරිපාලන දිස්ත්‍රික්කය : ..........................................................................................

3. නාමයෝජනාව ඉදිරිපත් කරන දිසාපති / ප්‍රාදේශීය ලේකම් පිළිබඳ විස්තර :

   (අ) ඔබගේ සම්පූර්ණ නම : ..........................................................................................

   (ආ) ඔබගේ රාජකාරි ලිපිනය : ..........................................................................................

   (ඇ) ඔබ දිසාපතිව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? : ....................................................

   (ඈ) ඔබ ප්‍රාදේශීය ලේකම්ව සිටින්නේ කුමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද ? : ............................................................................
   ........................................................

4. නාම යෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තර :

   (අ) ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ නම : ..........................................................................................

   (ආ) ඔහු/ඇය රාජ්‍ය නිලධාරියෙක් ද? එසේනම් ඔහු/ඇය දරන තනතුර සඳහන් කරන්න. : ................................................................
   ..................................................................

   (ඇ) උපන් දිනයඃ ..........................................................................................

   (ඈ) ජාතික හැඳුනුම්පත් අංකයඃ ..........................................................................................

   (ඉ) දුරකථන අංකයඃ..........................................................................................

   (ඊ) ඔහුගේ/ ඇයගේ රාජකාරි ලිපිනය/පෞද්ගලික ලිපිනය : ..............................................

5. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිතව සඳහන් කරන්න.

   ........................................................................................................................................

............................
අත්සන.
(මුද්‍රාව තිබේනම්)

දිනය : ..............................

EG 06-0013/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.